**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.12,184,995 ක දායක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිලධාරීන් හා සේවකයින් 12 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු දින 179 ක් සඳහා අයවිය යුතු රු.312,552 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ඉකුත් වර්ෂයේ දී ලැබී තිබුණු ගැල්වනයිස් බට 488 කින් ගැල්වනයිස් බට 226 ක රු.233,020 ක් වූ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කරන ලද කර්මාන්ත 05 ක් සඳහා ගෙවිය යුතු රු.4,800,000 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු පාලන ගිණුම්**

-----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.20,104,567 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර වෙනස්කම් දක්නට ලැබුණු අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.191,042 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ එකතුව රු.21,354,998 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙළඳ සැල් 46 කට අදාළව බදුකරුවන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.702,113 ක එක්වන් මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දීත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.11,542,628 ක වැට් බදු ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඈ) 2012 වර්ෂයේ සිට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.522,500 ක ණය හා රු.174,724 ක් වූ ණය පොලී මුදල් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 03 දක්වා කාලයට අයත් රු.14,020,642 ක ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

එකතුව රු.220,074,520 ක් වටිනාකම වූ ස්ථාවර වත්කම් අයිතම 04 ක් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛන ද, රු.3,313,870 ක් වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තාද, රු.522,500 ක් වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ණය ශේෂය සඳහා ණය ලේඛනය, රු.12,053,684 ක් වූ කර්මාන්ත ණයගැති ලේඛන හා කාල විශ්ලේෂණ ද, රු.200,000 ක ඉන්ධන තැන්පතුව හා රු.85,248 ක් වූ වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා ගිණුමට අදාළ ශේෂ සනාථද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1971 අංක 15 දරන සේ.අ.අ. පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේ.අ.අ. පනතේ 16 වන වගන්තිය | නියමිත පරිදි දායක මුදල් නොගෙවීම නිසා 2016 වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලට රු.88,702 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103 හා 104 | උතුරුමාගල ආදාහනාගාරයේ සිදු වී ඇති පිපිරීමකින් සිදුවී තිබුණු රු.1,664,500 ක අලාභය හා රක්ෂණ ආවරණය නොමැතිව J.C.B. යන්ත්‍රය ධාවනයේදී අනතුරට පත්වීමෙන් සිදු වූ අලාභය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එමෙන්ම මෙම අලාභ, හානි පාඩු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.17,252,259 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.12,722,654 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,529,605 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට ආදායම් විෂයයන් 05 ක රු.4,736,162 ක වැඩිවීම් හා වියදම් විෂයයන් 05 ක රු.206,557 ක අඩුවීම් ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 වරිපනම්

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබුණු එකතුව රු.3,326,544 ක් වූ වරිපනම් බදු මුදලින් වර්ෂය තුළ අයකිරීම සියයට 7.4 ක් තරම් අවම අගයක් විය. එම හේතුව නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය 3,079,874ක් විය.

**2.2.2 අක්කර බදු**

**------------**

ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අක්කර බදු රු.76,708 ක් අය කරගත යුතුව තිබුණද, වර්ෂය තුළ අය කරගෙන තිබුණේ රු.2,943 ක් හෙවත් සියයට 3.8 ක් තරම් අවම අගයකි.

ඉහත අංක 2.2.1 හා 2.2.2 ඡේදවල දැක්වෙන හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.3 බදු කුලී**

**---------**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.12,477,146 ක් වූ බදු කුලී මුදලින් වර්ෂය තුළ අයකර තිබුණේ රු.4,732,780 කි. මේ හේතුව නිසා වර්ෂය අවසානය වනවිට හිඟ මුදල රු.7,744,366 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.4 බලපත්‍ර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට වූ රු.123,350 ක හිඟ බලපත්‍ර ගාස්තුවලින් කිසිදු මුදලක් අයවී නොතිබුණු අතර, මේ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.1,956,917 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.26,985,171 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**--------------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පුර නැගුම ව්‍යාපෘතිය මඟින් ඌරගස්මංහන්දිය නගරයට ලබා දී තිබුණු පොදු වැසිකිලිය 2017 ජුනි මස දක්වා ම බදු දී නොතිබුණි. මේ නිසා සභාවට උපයා ගත හැකිව තිබූ ආදායම් අහිමි වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කෙරේ.

(i) අනුමත සේවක සංඛ්‍යා සැලැස්මේ තනතුරු 07 ක පුරප්පාඩු පැවති අතර, අතිරික්ත සේවක සංඛ්‍යාව 13 ක් විය. පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට මෙන්ම අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවී සභාව විසින් අනියම් පදනම මත බඳවාගත් සේවකයින් 06 දෙනෙකු සඳහා 2016 වර්ෂය තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු.769,684 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) සභාවේ පවත්වාගෙන යන ජංගම ගිණුම් තුනක සමාලෝචිත වර්ෂයේ රු. 3,578,761 ක මාසික සාමාන්‍ය ශේෂයක් පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 171 හා 184 වගන්ති ප්‍රකාරව අතිරික්තව ඇති මුදල් ආයෝජනය කිරීමට කටයුතු නොකිරීමෙන් සභාවට උපයාගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) (i) සභා බලප්‍රදේශයට අයත් වෙළඳ සංකීර්ණ හතරක බදුකරුවන් 40 දෙනෙකු 2016 දෙසැම්බර් 31 දින වනවිට රු.1,600,128 ක් කඩ කාමර කුලී ගෙවා නොතිබුණි. දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ දපපා/පපාකො/2010/10 චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර කඩ කාමර 05 ක් සඳහා ගිවිසුම්ගත වී නොමැති අතර, කඩ කාමර 35 ක බදු ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) දංගහවිල සමන් සෙනෙවිරත්න ප්‍රජා කේන්ද්‍රයේ පැවති කඩ කාමර 04 න් එක් කඩ කාමරයක් බදු දී නොතිබුණ අතර, අනෙකුත් කඩ කාමරවල ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරීන් 45 දෙනෙකුගෙන් අයවිය යුතු රු.410,786 ක් වූ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 01/2014 දරන 2014 පෙබරවාරි 24 දිනැති මුදල් චක්‍රලේඛයට අනුකූල නොවී 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සේවකයන් 41 දෙනෙකුගෙන් සේවක ඇප වශයෙන් අයකර ගත් රු.95,900 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

(උ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 චක්‍රලේඛයේ ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර, වීථි පහන් ලේඛනයක් නඩත්තු කර, නව වීථි පහන් සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ගිවිසුම් වලට එළඹීමට ක්‍රියා නොකිරීම නිසා වීථි පහන් නඩත්තුව වෙනුවෙන් 2016 වර්ෂය තුළ සභාව විසින් දරා තිබුණු රු.1,275,445 ක වියදම් විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඌ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු අංක 252 – 6570 දරන ඩබල් කැබ් රථ සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.2 හඳුනාගත් අලාභ**

-------------------

සමාලෝචිත වර්ෂයේ දී J.C.B යන්ත්‍රයක සිදු වූ අනතුරකින් රු.540,000 ක අලාභයක් සිදු වී තිබුණි. මෙම වාහනය අනතුර සිදු වූ දිනයට අදාළ 2016 සැප්තැම්බර් 01 දින සිට 2016 නොවැම්බර් 30 දින දක්වා කාලසීමාවට අදාළව රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබුණි. එමනිසා මෙම අලාභය රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට සභාවට නොහැකිව තිබුණි.

**3.3 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සභාවේ පවතින තක්සේරු කර නොමැති ට්‍රැක්ටර් ටේලරය හා අංක රහිත ජල බවුසරය ධාවන කටයුතු සඳහා යොදා නොගන්නා නමුත්, එම වාහන සම්බන්ධයෙන් 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු පිරිවැය රු.24,928,666 ක් වූ මෝටර් ග්‍රේඩරය භාවිතයට නොගෙන සභා භූමියේ ගාල්කර තිබුණි.

**3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

සභා බලප්‍රදේශයේ කසල බැහැර කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කරන්දෙණිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ සහ ඌරගස්මංහන්දිය සහ කුරුඳුගහහැතැක්ම යන ප්‍රදේශවල කසළ එකතු කිරීම සඳහා වර්ෂය තුළ රු.7,805,721 ක වියදම් දරා රජයට අයත් පුංචි බොරකන්ද වත්තට බැහැර කර පස් දමා වසා තිබුණි. එකතු කරන ලද නොදිරන කසළ කුරුඳුගහ හැතැප්ම සභාවේ ගොඩනැගිල්ලක එකතු කර, වර්ග කර තිබුණ ද, එම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) පුරනැගුම ව්‍යාපෘතියෙන් 2016 වර්ෂයේ දී රු.12,698,000 ක් වටිනා ගාබේජ් කම්පැක්ටර් රථයක් ලබා දී තිබුණ ද, අපද්‍රව්‍ය බැහැර කරන වත්ත වෙත ළඟාවිය නොහැකි බැවින් එම රථයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට සභාවට නොහැකි වී තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

----------------------------------------

**4.1 ක්‍රියාකාරී සැලැස්ම**

----------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් 2017 ජුනි 20 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 4.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01 /නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබීම නිසා අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

## 4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.5 නොවිසඳී ඇති හා පිළිතුරු නොලත් විගණන විමසුම්

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.2 ඡේදයේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ (අ) සිට (ඔ) දක්වා ඡේද 11 ක් සම්බන්ධයෙන් 2016 වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් පන්ති අනුව වෙන් වෙන්ව විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | පරිගණක සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | විධිමත් පරිදි වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (ii) | ඇතැම් වාහන කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (iii) | සභාවට ලැබුණු වාහනවල අයිතිය පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. |
| | | (iv) | වාහන 05 ක සමාලෝචිත වර්ෂයේ දෛනික ධාවන සටහන්පත් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර, ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |
| | | (iii) | වර්ෂ 05 කට වරක් තක්සේරු සිදුකර වරිපනම් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | අවශ්‍ය ගැලපීම් කර, ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර වෙනස්කම් පැවැතුණි. |
| | | (iii) | ඉකුත් වර්ෂවල සිට පැවතෙන ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| | | (iv) | සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.<br><br>* හානි පිළිබඳ ලේඛනය.<br>* ණයහිමි ලේඛනය.<br>* දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ලේඛනය.<br>* වාහන පිළිබඳ ලේඛනය. |
| | | (v) | කල් ඉකුත් වූ පොදු තැන්පත් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට සහ පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් නියමිත පරිදි ඇප තබා නොතිබුණි. |

(iii) අයකර ගන්නා ලද සේවක ඇප මුදල් බැංකුවක තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) අය නොවන සේවක ණය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) අයවැය පාලනය

(i) අයවැය ලේඛනයේ දක්වා තිබූ ආදායම් විෂයයන් 04 ක අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි වූ අවස්ථා පැවැතුණි.

(ii) වැය විෂයයන් 04 ක ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

(iii) ආදායම් හා වියදම් පිළිබඳව පසු විපරම් කර, අයවැය සංශෝධනය කර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.